# ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
# කොළඹ
***

## පුවත්පත් නිවේදනය

## ඉන්දියාවෙන් කෘත්‍රිම පාද කඳවුරක්

කෘත්‍රිම පාද ලබාදීම සඳහා වන කඳවුරක් 2022 පෙබරවාරි 2 වන දින වාරිමාර්ග අමාත්‍ය, ජාතික ආරක්ෂාව සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය සහ ඉන්දියා - ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සභාපති ගරු චමල් රාජපක්ෂ මැතිතුමා සහ ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා විසින් ගම්පහ රණවිරු සේවා අධිකාරියේ දී විවෘත කෙරිණ.

2. මසකට වැඩි කාලයක් පුරා පැවැත්වෙන මෙම කඳවුර රටෙහි විවිධ ප්‍රදේශයන්හි විවිධ සමාජ කාණ්ඩවල ජනතාවට සේවය සපයනු ඇත.

3. මෙම කඳවුර ඉන්දීය රජයේ සහයෝගය ඇතිව කායික වශයෙන් ආබාධිත වූවන්ගේ කායික සහ සමාජ ආර්ථික පුනරුත්ථාපනය වෙනුවෙන් කටයුතු කරන ඉන්දියානු රාජ්‍ය නොවන සංවිධානයක් වන භග්වන් මහාවීර් විකලාංග් සහායත සමිතිය (BMVSS) විසින් පවත්වනු ලැබේ. ජයිපූර් නගරය කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක මෙම රාජ්‍ය නොවන සංවිධානය 1975 වසරේදී ආරම්භ කර ඇත. එසේම එය කෘත්‍රිම පාද සහ වෙනත් එවැනි ආධාරක සම්බන්ධයෙන් කටයුතු කරන ලොව විශාලතම සංවිධානය ද වේ.

4. BMVSS ආයතනය මෙයට පෙර 2010 මාර්තු - අප්‍රේල් මාසවලදී වව්නියාවේදී සහ 2011 සැප්තැම්බර් මාසයේදී යාපනයේදී කඳවුරු දෙකක් සංවිධානය කර තිබිණ. පුද්ගලයන් 2500කට අධික පිරිසක් මෙම කඳවුරු වලින් ප්‍රතිලාභ ලබා තිබූ අතර 1600කට අධික පිරිසක් 'ජයිපූර් පාද' ලබා ගෙන තිබිණ.

5. මෙම කෘත්‍රිම පාද කඳවුර විවෘත කිරීම 2022 ජනවාරි 26 වන දින ජනරජ දිනයෙන් ඇරඹි 75 වන ඉන්දීය නිදහස් දින සැමරුම් සතිය නිමිත්තෙන් සිදුකරන වැඩසටහන් වලින් එකකි. ඉන්දියාවේ බොදු උරුමය පිළිබඳ ප්‍රදර්ශනයක් සහ කොළඹ විශ්ව විද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ ගුරුදේව් රවීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ උඩුකය පිළිරුවක් නිරාවරණය කිරීම වැනි දේ ද මෙම සැමරුම්වලට අයත් වේ. මෙම කෘත්‍රිම පාද කඳවුර ශ්‍රී ලංකාව සමඟ සංවර්ධන සහයෝගීතාවය සඳහා ඉන්දියානු රජයේ දර්ශනය එනම් ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතාවයන්ට අනුකූලව ශ්‍රී ලාංකික ජනතාවගේ ජීවිතවල සුබදායී බලපෑමක් ඇති කිරීමට ගන්නා ප්‍රයත්නය පිළිඹිබු කරයි.

***

කොළඹ
2022 පෙබරවාරි 02